www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ මැතිවරනය ගැඹුරු දේශපාලන අර්බුදයක වේදිකාව සකසයි

**Sri Lankan election sets stage for deep political crisis**

**කේ. රත්නායක විසිනි**

2010 ජනවාරි 26

අද පැවැත්වෙන ජාතික ඡන්දයෙන් කුලුගැන්වෙන ජනාධිපතිවරනය, බලයේ සිටින ජනාධිපති මහින්ද රාජපක්ෂ හා ඔහුගේ විරුද්ධවාදියා වන හිටපු හමුදාපති සරත් ෆොන්සේකා යන ප්‍රධාන අපේක්ෂකයන් දෙදෙනා විසින් එකිනෙකාට විරුද්ධව එල්ල කරගන්නා ලද කටුක චෝදනා හා ප්‍රති චෝදනා වලින් ද ප්‍රචන්ඩත්වයෙන් ද සලකුනු කෙරී තිබුනි.

අපේක්ෂකයන් දෙදෙනාම සූදානම් වන්නේ ජයග්‍රහනය ප්‍රකාශ කිරීමට හා එසේ නැතිනම් පැවැත්වූ මැතිවරනයේ ප්‍රතිපලය මත දේශපාලන-ව්‍යවස්ථා අර්බුදයකට තුඩුදෙන ඡන්ද මගඩි පිලිබඳ චෝදනා නැගීමටය.

තව ද, ඡන්දදායකයන් පෝලිම් ගැසී සිටින අතරතුර, පැවැත්වූ මැතිවරනයේ ප්‍රතිපලය හමුවේ හමුදා නිලධාරින් කුමක් කරනු ඇත් ද හා ඔවුන්ගේ ලැදියාව පවත්නේ කා සමඟ ද යන්න මැන බැලීම සඳහා අපේක්ෂකයින් හා ඔවුන්ගේ ප්‍රධාන ආධාර කරුවන් විසින් ඔවුන්ගේම රහසිගත මත විමසුමක්, තරකරනු ලැබ ඇති මිලිටරි-ආරක්ෂක අංශ තුල පවත්වමින් සිටින බවට ද තොරතුරු හෙලිවී තිබේ.

ජනවාරි 23 දින පිලියන්දලදී පවත්වන ලද සිය අවසාන ජන රැලියේදී කථාකරමින් ජනාධිපති රාජපක්ෂ, "ජනවාරි 26 දිනත්, 27 හා 28 දින වලත් ඉන් ඉදිරියටත් ජනාධිපති වන්නේ මමයි. අපි මෙම කුමන්ත්‍රනකරුවන්ට (විරුද්ධ අපේක්ෂක ෆොන්සේකා හා ඔහුගේ ආධාරකරුවන්) රට බෙදීමට ඉඩ නොදෙන්නෙමු" යයි ප්‍රකාශ කලේය.

පසුගිය වසරේදී එල්ටීටීඊය මිලිටරි වශයෙන් පරාජය කරන තෙක්ම එය සමඟ පෙලගැසී සිටි, ටීඑන්ඒ හි සහයෝගය ලබාගැනීම මගින් ඔහු රට පාවාදෙන බවට දෙමල පීඩිතයන්ට එරෙහිව ගෙනගිය යුද්ධයේදී මැතක් වන තෙක්ම තමන්ගේ ඉහලම හමුදා නායකයාව සිටි ෆොන්සේකාට රාජපක්ෂ දිගින් දිගටම චෝදනා කලේය.

23 සවස පැවති මාධ්‍ය හමුවේදී ෆොන්සේකා ප්‍රකාශ කලේ, ඔහු තැපැල් ඡන්දය දිනා ඇති බවය. සිය ජයග්‍රහනය නිශ්චිත බව පලකරමින් ඔහු ඇඟවුම් කලේ, රාජපක්ෂ කෙරෙහි හමුදාවේ නායකයන්ගේ ආකල්පය පිලිබඳව ඔවුන් සමඟ සාකච්ඡා කල බවයි.

මාධ්‍යකරුවන් අමතමින් ෆොන්සේකා මෙසේ පැවසීය. "27 වන දින මාගේ ජයග්‍රහනය වැලැක්වීමට මිලිටරි කුමන්ත්‍රනයක් සිදුකලහොත් මා කුමක් කරන්නේ දැයි එක් මාධ්‍යකරුවෙක් මගෙන් විමසුවා, හමුදාව කිසිදු නීතිවිරෝධී කටයුත්තක නොයෙදෙනු ඇති බව මට විශ්වාසය. හමුදාවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට අප සමඟ සම්බන්ධකම් තිබෙනවා. එවන් දෙයකට උත්සාහ දැරුව හොත් එය කුමන්ත්‍රනකරුවන් වෙතම හැරකී වදිනු ඇත. හමුදාව ඔවුන්ට එරෙහිව යනු ඇත."

එම මාධ්‍ය හමුවේදී ම ෆොන්සේකා ප්‍රකාශ කලේ, ආන්ඩුව උතුරේ සමහර හමුදා ආඥාපතීන්ට කොලඹට පැමිනෙන ලෙස දන්වා ඇති බවයි. ඔහු නිශ්චිතව සඳහන් නොකල ද ඉන් අදහස් කලේ, රාජපක්ෂ හා පාලක කල්ලිය ෆොන්සේකාට ලැදි අය ලෙස සලකමින් ඔවුන් ඡන්ද මගඩිවලට ඉඩ සැලසෙන පරිදි එම ප්‍රදේශයෙන් ඉවත්කර තැබීමට කටයුතු කරන බවයි.

විදේශ ඇමති රෝහිත බෝගොල්ලාගම සිය අදහස් දක්වමින්, මැතිවරන කටයුතු සඳහා හිටපු හමුදා මේජර් වරයෙකු යටතේ හමුදාව හැරගිය 600-800 අතර පිරිසක් යොදාගෙන ඇති බවට ෆොන්සේකා කඳවුරට චෝදනා එල්ල කලේය. ඡන්ද ප්‍රෝඩාවක ප්‍රතිපලය බව කියා සිටිමින් ආන්ඩුවේ ධනේශ්වර විරුද්ධවාදීන් රාජපක්ෂගේ ජයග්‍රහනය නොපිලිගැනීමට ඇති ඉඩ කඩ ගැන ඒඑෆ්පී වාර්තාවකරුවෙකු නැගූ ප්‍රශ්නයට පිලිතුරු වශයෙන් බැරෑරුම් අර්බුදයක හැකියාව බැහැර කල බෝගොල්ලාගම කියා සිටියේ "ශ්‍රී ලංකාවේ ජනතාවට වීදිවල විරෝධතා දැක්වීමට වේලාවක් නැති" බවය.

මැතිවරන කොමසාරිස්ගේ උපදෙස් නොතකා හල ආන්ඩුව, මැතිවරන ප්‍රචන්ඩ ක්‍රියා මාලාවක් ඇවිලවූ අතර මැත දිනවලදී මැතිවරන ප්‍රතිපල කෙසේ විකාශනය විය යුතුදැයි නියෝග පැනවීමේ පැහැදිලි අරමුන සහිතව හා ඒවායේ වලංගුභාවය පිලිබඳ මතුවන විරෝධතා වාර්තාකරනයට එරෙහිව, ජාතික මාධ්‍ය ජාලය මත සිය පාලනය ශක්තිමත් කර ගැනීම සඳහා පියවර ගත්තේය.

රාජපක්ෂ විසින්ම ප්‍රකාශයට පත්කල "ආර්ථික යුද්ධය" සඳහා සිය දැත් ශක්තිමත් කරගැනීමේ අරමුනෙන් ඔහු, නියමිත කාලයට දෙවසරකට කලින් ජනාධිපතිවරනය කැඳවූ බව සමාජවාදී සමානතා පක්ෂය හා එහි අපේක්ෂක විජේ ඩයස් විසින් පෙන්වාදී තිබුනි. යුද වියදම් මගින් හා ලෝක ආර්ථික අර්බුදය නිසා උග්‍ර අතට හැරුනු නිර්යාත පහත වැටීමෙන්, ඇවිලවූ ගෙවුම් ශේෂ අර්බුදය මඟහැර ගැනීම සඳහා පසුගිය ජූලි මාසයේ ලබාදුන් ඩොලර් බිලියන 2.6 ක ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (ජාමූඅ) නයත් සමග නියෝග කර තිබෙන රුදුරු කොන්දේසි ක්‍රියාත්මක කිරීම ද මෙම ආර්ථික යුද්ධයට ඇතුලත්ය.

කෙසේ වුව ද මෙම න්‍යාය පත්‍රය ක්‍රියාවට නැගීමෙහිලා රාජපක්ෂගේ හැකියාව ගැන විශ්වාසය නොතැබූ පාලක ප්‍රභූවේ සැලකිය යුතු කොටසක් කම්කරු පන්තියට මුහුන දියහැකි වඩා ප්‍රබල අපේක්ෂකයා ලෙස ජෙනරාල් ෆොන්සේකා දැකගත් අතර ඔහු වටා රැලිවිය. මහා ව්‍යාපාරිකයන්ගේ වැඩි කොටසක් මෙන්ම දක්ෂිනාංශික එක්සත් ජාතික පක්ෂය (එජාප) හා සිංහල ස්වෝත්තමවාදී ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) ද ඔහුට පිටුබලය දුන්හ.

රාජපක්ෂ විසින් චීනය සමග සමීප සබඳතා ගොඩනගාගන්නා අතර, එක්සත් ජනපදයෙන් හා ඉන්දියාවෙන් කොලඹ ඈත්කර තැබීමේ කාරනය ද මෙම කොටසේ කනස්සල්ලට හේතුවී තිබුනි. මෙ ස්ථරයන් නොසතුටට පත් කල තවත් කාරනයක් වූයේ, ජනාධිපති දේශපාලන බලය සිය පවුල පදනම්කරගත් කුඩා කල්ලියක් හා හමුදා නිලධරය අත රඳවා තිබීම යි.

රාජපක්ෂගේ නිල කාලය යුද්ධයෙන්, දැඩි වන මර්ධනයෙන් හා දේශපාලන ප්‍රචන්ඩත්වයෙන් සලකුනුවී තිබුනු තත්වය හමුවේ, ෆොන්සේකා තමන් ප්‍රජාතන්ත්‍රවාදය නියෝජනය කරන්නේ යයි කියා පෑ නමුත් ඔහු ද රාජපක්ෂ මෙන්ම යුද අපරාධවලට වගකිවයුතු අතර දැඩි සිංහල ස්වෝත්තමවාදියෙකි. 26 වසරක් පැවති යුද්ධය අවධියේ දැවැන්ත හමුදා බලඇනිවලින් පටන්ගෙන තරකර තිබෙන පොලිස්-රාජ්‍ය යාන්ත්‍රනය එලෙසම පවත්වාගැනීම ඔහුගේ අභිප්‍රාය වී තිබේ.

හිටපු ජනාධිපති වශයෙන් ද පාලක ශ්‍රීලංකා නිදහස් පක්ෂයේ නායිකාව ලෙස ද රාජපක්ෂගේ පූර්වගාමී චන්ද්‍රිකා කුමාරතුංග මැතිවරන ව්‍යාපාරයේ අවසන් දිනවලදී ජනාධිපති වීමේ ෆොන්සේකාගේ ව්‍යායාමයට අනුමැතිය පලකිරීමෙන් පසුව ඔහුට මූලික උත්තේජනයක් සැපයුනි. කුමාරතුංග මෙසේ කීවාය. "භීෂනය, ප්‍රචන්ඩත්වය හා දූෂනය පිලිබඳව මා ගැඹුරින්ම කනස්සල්ලට පත්ව සිටින අතර සිව් වසරක නිහඬතාවය අවසන් කිරීමට මම තීරනය කලෙමි." එහෙත් ඇගේ ආන්ඩුව ගැන සඳහන් කිරීමේදී ද එම වචනම යොදාගත හැකිය.

රාජපක්ෂ සිය අවසාන මැතිවරන රැලිවල දී "ජාත්‍යන්තර කුමන්ත්‍රනකරුවන්ගේ" පිටුබලය ලබාගන්නා බවට සිය ප්‍රතිවාදියා වෙත චෝදනා එල්ල කලේය. ඔහු ඉන් එහාට යමක් සඳහන් නොකල නමුදු, අවස්ථා ගනනාවක දී ම ඔහු එක්සත් ජනපදය හා යුරෝපා සංගමය සමග ඕනෑවට වඩා සමීප වීම පිලිබඳව විරුද්ධ පක්ෂයට චෝදනා කර තිබුනි.

තමන්ගේ පාර්ශවයෙන් ෆොන්සේකා, සිය අවසාන මාධ්‍ය හමුවේදී කියා සිටියේ කිසියම් ඡන්ද මගඩියක් සිදුවුවහොත් තමන් මහා බලවතුන් වන "ජාත්‍යන්තර ප්‍රජාව" අමතන බවය.

බීජිනය හා කොලඹ අතර ගොඩනැගෙන බැඳීම් කෙරෙහි ප්‍රතිචාර දැක්වීමට තීරනය කර සිටින බව වොෂින්ටනය දැනුම්දී තිබුනු අතර, කුමන හෝ මැතිවරන අර්බුදයකදී, සිය අභිමතය ක්‍රියාවට නැගීම සඳහා එය ඩැහැගනු ඇති බව නිසැකය.

දක්ෂිනාංශික ධනේශ්වර කඳවුරු දෙකටම එරෙහිව කම්කරු පන්තියේ ස්වාධීන මැදිහත්වීමක් නොපැවති තත්වය හමුවේ පැවැත්වූ මැතිවරනයේ ප්‍රතිපලය මඟින් උද්ගත කරන තත්වය තීන්දු කිරීමේදී, ප්‍රධාන භූමිකාවක් රඟදැක්වීමට අවසානයේදී මිලිටරියට හා විදේශ බලවතුන්ට අවස්ථාව සැලසෙනු ඇත.

මිලිටරියේ හා එහි නිලධරයේ දේශපාලන හොරනෑකරුවන් පිලිබඳ ප්‍රශ්නය දැනටමත් ජනමාධ්‍ය තුල ක්‍රියාශීලී ලෙස සාකච්ඡාවට බඳුන්වන මාතෘකාවක්ව තිබීම ශුභ ලකුනක් නොවේ.

හමුදාව තුල සේවයේ සිටින හා හිටපු පුද්ගලයන් ක්‍රියාශීලීව ෆොන්සේකාට සහායදෙන බව හා විශ්‍රාම ලත් ජෙනරාල්ගේ ව්‍යාපාරය නගාසිටුවනුවස් හමුදා නිලධාරීන් නිවාඩු ලබා සිටින බව විරුද්ධවාදී කඳවුරේ සන්ඩේ ලීඩර් පත්‍රයේ ඩී.බී.එස්. ජෙයරාජ් විසින් පසුගිය සති අන්තයේ පලකල තීරුලිපියක හෙලිකර තිබුනේ ය.

මිලිටරි වාඩිලෑමට යටත්ව තිබෙන, දෙමල බහුතරයක් වාසය කරන "උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල අලුත් වර්ධනයක් දැකගත හැකිය. එම ප්‍රදේශවල සේවය කරන හමුදා නිලධාරීහු, තමන් දන්නා කියන සිවිල් වැසියන්ට "වෙනසක්" සඳහා ඡන්දය පාවිච්චි කරමින් බුද්ධිමත්ව කටයුතු කරන ලෙස කියා

සිටිති. සාමාන්‍ය සොල්දාදුවෝ මෙහිදී වඩාත් කෙලින් කථා කරති. "ෆොන්සේකා මහත්තයාට" හෝ "ජෙනරාල් අයියාට" ඡන්දය දෙන ලෙස දෙමල බසින් ඔවුහු මිනිසුන්ට කියා සිටිති.

ජෙයරාජ් ප්‍රකාශ කලේ බුද්ධි අංශ ගනන් බැලීමකට අනුව, "දල වශයෙන් සියයට 75-80 අතර හමුදා සොල්දාදුවන් හා නිලධාරීන් පැරනි හමුදා නායකයාට බෙහෙවින්ම හිත පක්ෂපාතීය. නිලධාරීන් ගැන සලකන කල සියයට 40 ක් පමන ෆොන්සේකාගේ නිකායට අයත්ය. මොවුන්ගෙන් විශාල සංඛ්‍යාවක් කැප්ටන්ගේ සිට කර්නල් දක්වා ශ්‍රේනීන්ට අයත්ය.

"ෆොන්සේකා සංසිද්ධිය හමුදාව මත ඉමහත් බලපෑමක් ඇතිකර තිබේ. ගැඹුරු විභේදනයන් මතුවෙමින් තිබේ. තිරස් අතට මෙන්ම සිරස් අතට ද මෙම බෙදීම් ඇතිව තිබේ."

කුමන ක්‍රමයකින් හෝ දිනීමට අදිටන් කරගෙන සිටින රාජපක්ෂ. මැතිවරන නීති විවෘතව ම උල්ලංඝනය කර ඇත. ආන්ඩුව තම මඟපෙන්වීම අනුව කටයුතු නොකිරීම පිලිබඳව සිය නොසතුට හා සිත්තැවුල ඇඟවුම් කරමින් මැතිවරන කොමසාරිස් දයානන්ද දිශානායක, ජනවාරි 19 දින පැවති පක්ෂ නියෝජිතයන්ගේ කමිටු රැස්වීමකදී නිවේදනය කලේ මැතිවරනය අවසන්වූ වහාම තමන් රැකියාවෙන් ඉවත්වන බවයි.

දිශානායක රජයේ මාධ්‍ය ප්‍රචාරය ගැන යලි යලිත් විරුද්ධත්වය පලකොට තිබේ. ජනවාරි 12 දින ඔහු විසින් නම්කරන ලද රජයේ විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය නිසි බලධරයාට ඉන් ඉවත් වන ලෙස ඔහු නියෝග කලේය. එහි අර්ථය නම් මැතිවරන ව්‍යාපාරය තුල රාජ්‍ය මාධ්‍යය ප්‍රචාරය පාලනය කිරීමේ සියලු උත්සාහයන් නිර්නාමික තර්ජන නිසා අතහැර දැමූ බවයි. පැහැදිලිව ම ආන්ඩුව විසින් නියෝග කොට නොතිබුනේ නම්, රාජ්‍ය මාධ්‍ය මැතිවරන කොමසාරිස්ගේ උපදෙස් උල්ලංඝනය නොකරනු ඇත.

ජනාධිපති ඡන්දය ලඟාවෙමින් තිබියදී ආන්ඩුව මාධ්‍ය මත සිය ග්‍රහනය දැඩි කිරීමට උත්සාහ කරන්නේ යයි සිතිය හැකි පියවර ගනනාවක්ම ගෙන තිබේ.

23 දින ජාතික රූපවාහිනියේ ආන්ඩුවේ බලධාරීන් නිවේදනය කලේ, 26 හා 27 දිනවල එහි සේවකයන්ට නිවාඩු ලැබෙන බවය. වැඩට පැමිනීමට ඉඩ ලැබෙන්නේ තෝරාගත් සීමිත සේවක පිරිසකට පමනි. 26 දින රූපවාහිනී මධ්‍යස්ථානයට පැමිනි හමුදා නිලධාරීන් එහි කටයුතු පරීක්ෂා කලේය. සේවකයන් සැක කල ආකාරයට එම පියවර, ආන්ඩුව නියම කලහොත් රූපවාහිනී සේවා හමුදාව භාරයට ගැනීමේ සූදානමකි.

වාර්තාවී ඇති මැතිවරන ප්‍රචන්ඩ ක්‍රියා 950 කටත් වැඩි ගනනකින් බොහොමයක් උසිගන්වා තිබුනේ ද ආන්ඩුවේ ආධාරකරුවන් විසිනි. පහරදීම්, මිනීමැරුම් හා ප්‍රචාරක මෙවලම් හා මැතිවරන කාර්යාල විනාශ කිරීම් මීට ඇතුලත් විය. මැතිවරන ව්‍යාපාරය මධ්‍යයේ ඝාතනයට ලක්වූවන් පස් දෙනාගෙන් සතර දෙනෙක්ම ෆොන්සේකාගේ ආධාරකරුවන් ය.

මැතිවරන නිරීක්ෂකයන් සඳහන්කර තිබුනේ, ඡන්දදායකයන් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය තුල පැවති කැපී පෙනෙන හිඩැස් හා අවතැන්වීමේ බිහිසුනු කොන්දේසි ද උතුරේ පැතිර පවතින මිලිටරි වාඩිලෑම ද මැතිවරන අවභාවිතාවන්ට හා මගඩි වලට හේතු විය හැකි බවයි.

මැතිවරන මහලේකම් කාර්යාලයට අනුව, අවසාන දිනය වූ ජනවාරි 23 දින වන විට නොබෙදා තිබුනු ඡන්ද කාඩ්පත් සංඛ්‍යාව මිලියනයකි. උතුරේ වව්නියාව, මුලතිව්, කිලිනොච්චි, මන්නාරම හා යාපනයේ පමනක් නොබෙදූ කාඩ්පත් සංඛ්‍යාව ලක්ෂ තුනක් පමන විය. කාඩ්පත් ඡන්දය දැමීම සඳහා අනිවාර්ය නොවූව ද ඡන්ද පෙට්ටි පිරවීමේ වංචනික ක්‍රියාව සඳහා නොබෙදූ කාඩ්පත් පහසුවෙන්ම යොදාගත හැකිය.

ඡන්දය දැමීම සඳහා අනිවාර්යෙන් ඉදිරිපත් කල යුතු ජාතික හැඳුනුම්පත හෝ වෙනත් වර්ගයක හැඳුනුම්පතක් නොමැති පුද්ගල සංඛ්‍යාව මිලියනයක් විය. මැතිවරන නිරීක්ෂන කන්ඩායමක් වන පැෆරල් සංවිධානයේ ප්‍රකාශකයෙකු පැවසුවේ "මැතිවරනයට පෙර කඩි මුඩියේ තාවකාලික හැඳුනුම්පත් නිකුත්කිරීමට බලධාරීන් විසින් දරන ලද උත්සාහය තිබියදී වුවත් දිනය අවසානයේදී වැඩි නොවන්නේ නම් අඩුම තරමින් දශ ලක්ෂයක් වත් නොතකා හැරෙනු ඇති බව ලෙහෙසියෙන්ම කිව හැකි" බවයි.

බලය සඳහා පාලක කවයන්ගේ කටුක අරගලයක් මෙන්ම කම්කරු පන්තියේ සමාජ කොන්දේසි මත රුදුරු ප්‍රහාරයක් සඳහා මැතිවරනය වේදිකාව සකසා තිබේ.

© www.wsws.org